# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION

සුහුරුපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1172 / 2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திக<br>Date | 16/07/2024<br>පැය 1000 |

## මාධ්‍ය නිවේදනය

### හෙරොයින් සමඟ සැකකාරියක් අත්අඩංගුවට - මාතර අපරාධ කොට්ඨාසය.

2024.07.15 වන දින සවස් කාලයේ වැලිගම පොලිස් වසමේ බෝධිමළුව විහාරය අසලදී මාතර අපරාධ කොට්ඨාසයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 210 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකාරියක්** අත්අඩංගුවට ගෙන වැලිගම පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකාරිය වයස අවුරුදු 43 ක් වන දෙනිපිටිය ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

සැකකාරිය වැලිගම ප්‍රදේශයේ පාසලක අනධ්‍යන සේවිකාවක් ලෙස කටයුතු කරන අතර, මිදිගම ප්‍රදේශයේ සංවිධානාත්මක අපරාධ හා මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවෙකුගේ මත්ද්‍රව්‍ය ජාලයේ බෙදා හැරීමේ කටයුතු සිදු කරන බවට දැනට සිදු කරන ලද විමර්ශනයේදී අනාවරණය වී ඇත. මෙම සැකකාරිය මෑත කාලයේදී මත්ද්‍රව්‍ය ජාවාරම් සඳහා සම්බන්ධ වී ඇති අතර විදෙස්ගතව සිට මත්ද්‍රව්‍ය ජාලය මෙහෙයවන පුද්ගලයින් විසින් නම් කර එවනු ලබන පුද්ගලයින් වෙත මත්ද්‍රව්‍ය ලබා දීම සිදු කර ඇත. සැකකාරියගෙන් මත්ද්‍රව්‍ය ලබා ගන්නා පිරිසද කුඩා පරිමාණයෙන් මත්ද්‍රව්‍ය ජාවාරමේ යෙදී සිටින පුද්ගලයින් බවට හඳුනාගෙන ඇත.

සැකකාරිය විසින් සිදු කර ඇත්තේ ඇය වෙත ලැබෙන වැඩි මත්ද්‍රව්‍ය ප්‍රමාණය ළඟ තබා ගැනීමත් ඒවා විදේශ ජාවාරම්කරු විසින් නම් කරන පුද්ගලයන්ට අවශ්‍ය කරන ප්‍රමාණයන්ට ලබා දීමත්ය. සැකකාරිය පාසලක සේවය කරන කාන්තාවක් වුවද, මෙම ජාවාරම සඳහා පාසල කිසිම අවස්ථාවක සම්බන්ධ කර ගෙන නොමැති අතර ඇබ්බැහි වූවන් සඳහාද මත්ද්‍රව්‍ය අලෙවි කර නොමැති බව නිරීක්ෂණය වේ.

මාතර අපරාධ කොට්ඨාසය හා වැලිගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**